ජාතික ළමා සංවර්ධන අරමුදල  **- 2016**

**------------------------------------------**

ජාතික ළමා සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් **31** දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ  මූල්‍ය  ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ  ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට -(ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ . තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ  විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## **2.** **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

## **2.1** **මතය**

**----**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,996,766 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,987,857 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,909 ක වර්ධනයක් සිදුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ජාතික ළමා සංවර්ධන අරමුදලේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ළමා සංවර්ධන අරමුදල පිහිටුවීමේ අරමුණ වූයේ යුද වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමට නොහැකි වූ ශ්‍රී ලාංකික දරුවන්ට මූල්‍යමය ආධාර ලබා දීම වේ. 2014 ජනවාරි 24 දිනැති අමප/13/1436/528/008-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කොඩි අලෙවියෙන් ලැබෙන අරමුදල් ද උපයෝගී කර ගනිමින් අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජිත වැඩසටහන් වඩා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී කොඩි අලෙවියෙන් හා ස්ථාවර තැන්පත් ආයෝජන මඟින් ලද රු. 1,996,166 ක්වූ ආදායම ද ඇතුලත් වර්ෂ අවසානයේ පැවති රු. 4,748,346 ක මුදල ළමුන්ට ආධාර ගෙවීම සඳහා යොදා ගෙන නොතිබුණි.

අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ළමා දින කොඩි අලෙවි ආදායම වූ අතර, සමාලෝචිත වර්ෂයේ ළමා දිනය වෙනුවෙන් මුද්‍රිත කොඩි 400,000 ක් යැවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 387 කින් 2016 දෙසැම්බර් 31 වන විට රුස්කර ගත් රු. 1,307,196 ක් එවා තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 168 කින් පමණි. 2017 මැයි වන විටත් කාර්යාල 66 කින් මුදල් එවා නොතිබුණ අතර, කොඩි අලෙවියෙන් ඔවුන් කිසියම් මුදලක් රුස් කර ගෙන ඇත්නම් එය ගෙන්වා ගැනීමට හෝ ඒ සම්බන්ධව සොයා බැලීම සඳහා අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවක් විගණනයේ දී නිරීක්ෂණය නොවීය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ළමා සංවර්ධන අරමුදල ඇවර කිරීම

---------------------------------------

මෙම අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම වසා දමා එහි මුදල් පරිවාස ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන සෙවණ සරණ මාපිය කැපකරු ආධාර ක්‍රමයට සම්බන්ධ කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් 2017 මාර්තු 24 දින විමසීම් කර තිබූ අතර, ඒ පිළිබඳව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2017 මැයි 02 දිනැති අංක TOD/BEI/2/BA/120/2015 දරන ලිපියෙන් අරමුදල වෙත දන්වා තිබුණි. එසේ වුවද අරමුදල විසින් විගණිත දිනය වූ 2017 මැයි 09 දින දක්වාම ඒ පිළිබඳ ක්‍රියාකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ  ආදායම් රැස්කර ගැනීමේ ප්‍රමාදයන්, රැස්කර ගත් මුදල් නිෂ්කාර්යව පැවතීම හා අරමුදල ඇවර කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වරින්වර දැනුම් දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.